දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

ආවිසා 2.2 - සාර්ව ආර්ථික න්‍යාය
ECG 2.2 - Macroeconomic Theory

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත**

---

01. පහත සංඛ්‍යා සටහන අංක 01 හි දැක්වෙන්නේ ශ්‍රී ලංකාව සඳහා 2011 වර්ෂයට ගණනය වී ඇති ජාතික ආදායම් ගිණුම් පෙළකි. උචිත දත්ත යොදා ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සංඛ්‍යා සටහන අංක 01
ශ්‍රී ලංකාවේ තෝරාගත් ජාතික ආදායම් ගිණුම් 2011

| අයිතමය | රුපියල් මිලියන (000) |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | 4568 |
| රජයේ පරිභෝජනය | 968 |
| පෞද්ගලික ආයෝජනය | 1551 |
| රජයේ ආයෝජන වියදම් | 410 |
| භාණ්ඩ හා සේවා අපනයන | 1509 |
| භාණ්ඩ හා සේවා ආනයන | 2461 |
| විදේශීය ශුද්ධ සංක්‍රාම | -72 |
| ජාත්‍යන්තර ත්‍යාග හා සංක්‍රාම ලැබීම් | 507 |
| ප්‍රාග්ධන ක්ෂය ප්‍රතිභාගය | 123 |
| ව්‍යාපාර වක්‍ර බදු | 407 |

(i) පහත සඳහන් දෑ ගණනය කරන්න.
- (අ) දළ දේශීය වියදම (Gross Domestic Expenditure)
- (ආ) වෙළෙඳපොල මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය (Gross Domestic Product at Market Prices)
- (ඇ) වෙළෙඳපොල මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය (Gross National Product at Market Prices)
- (ඈ) ශුද්ධ ජාතික නිෂ්පාදිතය (Net National Product)
- (ඉ) ජාතික ආදායම (National Income)

(එක් කොටසකට ලකුණු 3 බැගින් මුළු ලකුණු 15)

(ii) "ජාතික ආදායම් ගිණුම්" රටක ආර්ථික ක්‍රියාකාරිත්වය මැන දැක්වීමට ප්‍රමාණවත් වුවත් ජාතියක සමාජ සුභසාධනය මැන දැක්වීමේදී අසමර්ථතා බහුල දර්ශකයකි." (A.C.Pigou) සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

02. අංශ දෙකක් සහිත එක්තරා ආර්ථිකයක වැය කළ හැකි ආදායම සහ පරිභෝජනය අතර සම්බන්ධතාව පහත පරිදි විය.

| | | | | |
|---|---|---|---|---|
| වැය කළ හැකි ආදායම (Yd) $ | 200 | 400 | 600 | 800 |
| පරිභෝජනය (C) $ | 190 | 340 | 490 | 640 |

(i) (අ) මෙම ආර්ථිකයට අදාල පරිභෝජන ශ්‍රිතයේ ස්වායත්ත පරිභෝජන වියදම $ 40 ක් බව සනාථ කරන්න.

(ලකුණු 02)

(ආ) ආයෝජන වියදම $ 50 ක් ලෙස ඇස්තමේන්තු වන අවස්ථාවකට අදාල සමතුලිත ආදායම් මට්ටම $ 360 ක් බව සනාථ කරන්න.

(ලකුණු 03)

(ඇ) සමතුලිත ආදායම් මට්ටමේදී ඉතුරුම් $ 50 ක් වන බව සනාථ කරන්න.

(ලකුණු 03)

(ii) ඉහත විස්තර කරන ලද සංවෘත ආර්ථිකයට දැන් පහත සඳහන් රජයේ කටයුතු ද හඳුන්වා දෙනු ලැබුවේ යැයි සිතන්න.

- රජයේ වියදම් $(G) = \$ 100$
- ශුද්ධ බදු $T_{Xn} = 100 + 0.2\,Y$
- රජයේ සංක්‍රාම දීමනා $T_r = 100$

රජයේ කටයුතු ද ඇතුළත් මෙම ආර්ථිකයේ

(අ) සමතුලිත ආදායම $ 475 ක් බව

(ආ) සමතුලිත ආදායමේදී ඉතුරුම් $ 55 ක් බව සහ

(ඇ) රජයේ අයවැය හිඟය $ 5 ක් බව සාධනය කරන්න.

(එක් කොටසකට ලකුණු 04 බැගින් මුළු ලකුණු 12)

03. (අ) "මුදලට ඇති ඉල්ලුම" යන්නෙන් ඔබට අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 05)

(ආ) අවශ්‍ය තැන්හි උචිත රූප සටහන් යොදා ගනිමින් මුදලට ඇති ඉල්ලුමට හේතු විස්තර කෙරෙන කේන්ස් ගේ ද්‍රවශීලතාවරණ න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

04. පහත සංකල්ප යුගලයන් අතර වෙනස පැහැදිලි වන සේ විග්‍රහාත්මක සටහන් ලියන්න.

(අ) කේන්සියානු ආර්ථික විද්‍යාවෙහි එන සමස්ත ඉල්ලුම සහ සඵල ඉල්ලුම. (Aggregate demand and Effective demand)

(ලකුණු 10)

(ආ) පුද්ගල ආදායම සහ වැයකළ හැකි පුද්ගල ආදායම (Personal Income and Disposable Income)

(ලකුණු 10)

05. කල්පිත ආර්ථිකයක IS වක්‍රය හා LM වක්‍රය පහත දැක්වෙන සමීකරණ මගින් නිරූපනය වේ යැයි සිතන්න.

$$Y = 950 - 50r$$
$$Y = 500 + 25r$$

(i) මෙම ආර්ථිකයේ භාණ්ඩ වෙළෙඳ පොළ හා මුදල් වෙළෙඳ පොළ එක විට සමතුලිතවන පොලී අනුපාතිකය හා නිමවුම් මට්ටම ගණනය කරන්න.

(ලකුණු 04)

(ii) මෙම ආර්ථිකයේ පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගනිමින් නිමවුම් මට්ටම ඉහළ නංවා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි

(a) මූල්‍ය ප්‍රතිපත්ති

(b) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති

යුගලයන් නම් කරන්න.

(ලකුණු 04)

(iii) ඔබ විසින් ඉහත යෝජනා කරන ලද ප්‍රතිපත්ති යුගලය ක්‍රියාත්මක කිරීම මගින් යෝජිත ඉලක්කය කරා ලඟා විය හැකි ආකාරය සුදුසු ප්‍රස්තාරික නිරූපන සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

06. අර්වින්ග් පිෂර්ගේ (Irving Fisher) විනිමය සමීකරණයෙන් කියවෙන මූලික අදහස කුමක්දැයි පැහැදිලි කොට, එය වඩාත් යථාර්ථවාදී න්‍යායක් බවට පත්කිරීමට පසුකාලීන ආර්ථික විද්‍යාඥයින් විසින් දරන ලද ප්‍රයත්නයන් පිළිබඳ ඇගැයීමක් කරන්න.

(ලකුණු 20)

07. (i) "උද්ධමනය හා සේවා වියුක්තිය අතර හිලව්වක් (Trade-off) පවතින්නේ කෙටි කාලයේදී පමණි. දිගු කාලයේදී එබඳු හිලව්වක් නැත." අදාළ තැන්හි රූප සටහන් යොදා ගනිමින් මෙම ප්‍රකාශයේ න්‍යායාත්මක පදනම විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) "ශ්‍රී ලංකාව මෑත කාලීනව නිරුද්ධමනයකට (disinflation) මුහුණ දී ඇත." නිරුද්ධමනය යනු කුමක්දැයි හඳුන්වා, ශ්‍රී ලංකා ආර්ථිකය එබඳු තත්ත්වයක් කරා රැගෙන ගිය ආසන්නතම හේතු සාධක කවරේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

08. (i) රටවල් දෙකක් අතර භාණ්ඩ හුවමාරු අනුපාතිකය තීරණය වීමට එකී රටවල අභ්‍යන්තර හුවමාරු අනුපාතික අදාළ වන ආකාරය, සාපේක්ෂ වාසි න්‍යාය සම්බන්ධ කල්පිත උදාහරණයක් යොදාගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් වෙළෙඳ ශේෂය තුලනය කිරීමේ ස්වයං යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වන බව ආර්ථික න්‍යායේ කියවේ. ශ්‍රී ලංකාව 2001 වර්ෂයේ සිට පාවෙන විනිමය අනුපාතිය ක්‍රමයක් අනුගමනය කළ නමුත්, 1960 දශකයේ ආරම්භ වූ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂයේ හිඟය වසරින් වසර තවදුරටත් පුළුල් වෙමින් පවතී.
න්‍යාය හා භාවිතය අතර පවත්නා යටකී පරස්පරය ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

(ලකුණු 10)